# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන)

**රජයට හෝ රජයේ නියෝජ්‍යායතනයකට අයිති ඇතැම් සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම සහ බැහැර කිරීම සඳහා පහසුකම් සැලැස්වීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනත් කෙටුම්පතකි**

---

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් 2018 ජුනි මස 20 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2018 මැයි මස 25 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී.

---

**[254 වන පනත් කෙටුම්පත]**


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 12.00** **තැපැල් ගාස්තුව : රු. 10.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## බද්ධ නිවාස අයිතිකම්
## (විශේෂ විධිවිධාන)

එල්. ඩී.— ඕ. 50/2013.

**රජයට හෝ රජයේ නියෝජ්‍යායතනයකට අයිති ඇතැම් සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම සහ බැහැර කිරීම සඳහා පහසුකම් සැලැස්වීම සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ එයට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2018 අංක      දරන බද්ධ නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2.** මේ පනතේ විධිවිධාන මේ පනත ආරම්භ වන දින සිට වසර පහක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක විය යුතු ය. මේ පනත බලපවත්නා කාලසීමාව.

**3.** (1) 2009 දෙසැම්බර් 31 වන දිනයට පෙරාතුව ඉදිකරන ලද්ද වූ ද, — ඇතැම් සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කිරීම.

(අ) ජාතික නිවාස කොමසාරිස්වරයා;

(ආ) ජාතික නිවාස සංවර්ධන අධිකාරිය;

(ඇ) නාගරික සංවර්ධන අධිකාරිය;

(ඈ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව; හෝ

(ඉ) රජයේ සුනාමි නැවත පදිංචි කිරීමේ වැඩසටහන යටතේ රජයට අයිති ඉඩම්වල සහාධිපත්‍ය දේපළක් ඉදිකරනු ලැබ ඇති රජය හෝ වෙනත් යම් නියෝජ්‍යායතනයක්,

විසින් අයිතිය දරනු ලබන්නා වූ ද, විකිණීමෙන්, බදු දීමෙන්, කුලියට දීමෙන් හෝ කුලී සින්නක්කරයට දීමෙන් යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට සන්තකය පවරා දී ඇත්තා වූ ද සහාධිපත්‍ය දේපළ,-

(i) පළාත් පාලන ආයතනයක් විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම් නොමැති වීම;

(ii) පළාත් පාලන ආයතනයක් විසින් නිකුත් කරන ලද අනුකූලතා සහතිකයක් නොමැති වීම;

(iii) එක් එක් සහාධිපත්‍ය කොටස සඳහා වරිපනම් අංකයක් හෝ වෙනත් සංකේතයක් නොමැති වීම;

(iv) එම සහාධිපත්‍ය දේපළ පළාත් පාලන ආයතනයක් විසින් අනුමත කරන ලද ගොඩනැගිලි සැලසුම්වලට අනුකූල නොවීම;

(v) පවතින නීතියට අනුකූලව ඉදිකරනු ලැබ නොමැති සහාධිපත්‍ය දේපළක් වීම; හෝ

(vi) සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලැබ නොතිබීම,

නොතකා, එවැනි සියලු සහාධිපත්‍ය දේපළවල පිඹුරු, රෙජිස්ට්‍රාර්වරයා විසින් 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ 6 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් ලියාපදිංචි කිරීමක්, සියලු කාර්යයන් සඳහා මේ පනතේ විධිවිධාන යටතේ සිදු කරනු ලැබ ඇති ලියාපදිංචි කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද සහාධිපත්‍ය දේපළක අයිතිකරු විසින්, එම සහාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ලබාගත් ලිඛිත ප්‍රකාශයක්, එම සහාධිපත්‍ය දේපළ ලියාපංදිචි කරන අවස්ථාවේ දී රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දිය යුතු ය.

(4) යම් විශේෂිත සහාධිපත්‍ය දෙපළක් අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තියේ (අ) සිට (ඉ) දක්වා වූ ඡේදවල (එම ඡේද දෙක ද ඇතුළත්ව) නිශ්චිතව සඳහන් කරන ලද ආයතනවලට අයිති බවට ද 2009 දෙසැම්බර් මස 31 වන දිනට පෙරාතුව ඉදිකරනු ලැබ ඇති බවට ද විකිණීමෙන්, බදු දීමෙන්, කුලියට දීමෙන් හෝ කුලී සින්නක්කරයට දීමෙන් යම් තැනැත්තකුට එම දේපළෙහි සන්තකය පවරා දී ඇති බවට ද, ජාතික නිවාස කොමසාරිස්වරයාගේ, ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරිවරයාගේ, නාගරික

සංවර්ධන අධිකාරියේ සභාපතිවරයාගේ, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාවේ සභාපතිවරයාගේ හෝ ඉඩම් සහ ඉඩම් සංවර්ධන විෂයය පවරා ඇත්තා වූ අමාත්‍යවරයාගේ හෝ රජයේ සුනාමි නැවත පදිංචි කරවීමේ වැඩසටහන යටතේ රජයේ ඉඩම්වල යම් සහාධිපත්‍ය දේපළක් ඉදි කිරීම සඳහා වගකිව යුතු වෙනත් යම් රාජ්‍ය නියෝජ්‍යායතනයක ප්‍රධානියකුගේ අත්සනින් නිකුත් කළ සහතිකයක්, එහි ඇතුළත් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගත යුතු සාක්ෂි විය යුතු ය.

අර්ථ නිරූපනය.

**4.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි —

"ජාතික නිවාස කොමසාරිස්වරයා" යන්නෙන්, (401 වන අධිකාරය වූ) ජාතික නිවාස පනත යටතේ පත් කරන ලද ජාතික නිවාස කොමසාරිස්වරයා අදහස් වේ;

"සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය" හෝ "අධිකාරිය"යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 10 දරන සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය අදහස් වේ;

"සහාධිපත්‍ය දේපළ" යන්නෙන්, 1973 අංක 11 දරන බද්ධ නිවාස අයිතිකම් පනතේ අදහස් වන පරිදි සහාධිපත්‍ය දේපළක් අදහස් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 43 වන වගන්තිය යටතේ නිවාස විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"ජාතික නිවාස සංවර්ධන අධිකාරිය" යන්නෙන්, 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අදහස් වේ;

"රෙජිස්ට්‍රාර්වරයා" යන්නෙන්, ලියාපදිංචි කළ යුතු සහාධිපත්‍ය දේපළ පිහිටා ඇති ලියාපදිංචි දිස්ත්‍රික්කය තුළ අධිකරණ බලය දරන (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපංදිචි කිරීමේ ආඥාපනත යටතේ පත් කරන ලද ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා අදහස් වේ;

"ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව" යන්නෙන්, 1968 අංක 15 දරන ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව අදහස් වේ;

"නාගරික සංවර්ධන අධිකාරිය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය අදහස් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**5.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.